

ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 මාර්තු 05 සඳුදා
04 වෙළුම - 19 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00



# ළමා ප්‍රදීපය



## ජේසුස් වහන්සේ අන්‍යරූප විලාශ වීමේ මංගල්‍යය

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# සිතුදේ නොමවේ , නොසිතු දෙයම වේ.

## ආදරණීය දුවේ පුතේ...

චතාරික සමයේ දෙවන ඉරුදිනත් දැන් අපි සමරනවා. පුංචි ඔබට ඉතාමත් ගැඹුරින් හිතන්නට මේ දවසේ මෙනෙහි කිරීම් හොඳින්ම උපකාරී වන බව කිව යුතුයි. ඒ නිසා ඒ මෙනෙහි කිරීමේ කරුණු එකින් එක ගෙන ඔබේ ශක්ති මට්ටමින් අවබෝධ කර දෙන්නට අද මෙම පිටුව වෙන් වෙනවා.

ආදර දුවේ පුතේ,

දේව සම්බන්ධය ලැබුවෙක් කියලා කියන්නේ දේව දරුවෙකුටමයි. ඒ දරුවා දේව ආදරයට ලක් වුවෙක් මයි. දෙවියන් වහන්සේ ලස්සන සැලැස්මක් මිනිස් වර්ගයා වෙත දනය කලා. ඒ දේව ආදරය නිසාමයි. දෙවියන්වහන්සේට අයිති ජනතාවක් මෙලෙස ඔවුන් වහන්සේ සුදනම් කලත් මිනිසාගේ ආත්මාර්ථකාමය මෙයට හරස් වුනා. ඒ ආත්මාර්ථකාමය නිසා මෙලොවට පැමිණි මරණයේ උදහසින් ගලවන්නට ගැලවුම් කාරයෙක් දෙන්නට දෙවියන් වහන්සේ පොරොන්දු වනවා. එලෙස පොරොන්දුවක් වන්නේ පාපයට ඇලී ගැලී දෙවියන් වහන්සේව අමතක කරන්නට යෙදුනු මනුෂ්‍ය වර්ගයාව දේව ආදරය තුළින් නැවත ගලවා ගන්නටයි. බලන්න, දේව සැලැස්ම ප්‍රතික්ෂේප කරපු ජනතාව දෙවියන්වහන්සේට කළ දේ. නෝවාගේ කථාන්දරය එයට හොඳම උදාහරණයයි. ජල ගැල්මෙන් එදා එලෙස ලොව විනාශ වුයේ දේව සැලැස්මට මිනිස් වර්ගයා පිටු පෑ නිසයි. නමුත් නෝවා මත දෙවියන් වහන්සේගේ ආදරය ප්‍රබලව පැවතියා. නෝවා පමණක් ජල ගැල්මෙන් ගැලවුනේ දෙවියන් වහන්සේ හා මිනිසා අතර ඇතිවූ ඒ පොරොන්දුව නව මිනිස් පරපුරක් හා තව දුරටත් සවි කර ගැනීම සඳහායි.

මිනිස් ජීවිත ප්‍රාණවත් කරන වැදගත් දේව දීමනාවක් තමයි, ජලය. පිවිතුරු බවටත් ජලය හොඳම සාක්ෂ්‍යයක්. ජලය නොමැති නම් එතැන ඇත්තේ මරණයයි. ජල ගැල්මෙන් එදා එලෙස නෝවාගේ දවසේදී පවුකාර මිනිසුන් විනාශ වුවත් ජලය තුළින්ම නව මිනිස් පරපුරක් නෝවා තුළින් බිහි කරන්නට දෙවියන් වහන්සේ ක්‍රියා කරනවා.

චතාරික සමයේ දෙවැනි ඉරුදින අපේ මෙනෙහි කිරීම තුළ එලෙස දෙවියන් වහන්සේගේ ආදරය පිළිබඳව හොඳින් හිතන්නට ශු. බයිබලය අපට අපමණ උදාහරණ හා සිදුවීම් ගෙන හැර දක්-වනවා. බලන්න ඊසාක්ගේ චරිතය. ආබ්‍රහම් තම මහලු වයසේ දේව පොරොන්දුව මත ලබාගත් එකම පුත්‍රයා ඊසාක්. එතැනදි දෙවියන් වහන්සේ ආබ්‍රහම්ගේ විශ්වාසය පරීක්ෂා කළ බලනවා. තම එකම පුත්‍රයා වන ඊසාක්ව දවන යාග පූජාවක් වශයෙන් මොරියා කන්ද මත ඔප්පු කරන්න කියලා දෙවියන් වහන්සේගෙන් අණක් ලැබෙනවා.

ආදර දුවේ පුතේ, දෙවියන් වහන්සේ මිනිස් හදවතේ විවෘත භාවය පරීක්ෂා කර බලන්නේ ඔහුගේ හෝ ඇයගේ ජීවිත පරිත්‍යාගය තුළයි. පරිත්‍යාගය එතරම් පහසු කටයුත්තක් නොවේ. මිනිසා ඇළුම් කරන සුව පහසුවට පටහැනි දෙයක් හැටියට පරිත්‍යාගය හඳුන්වන්න පුළුවනි. මිනිස් ජීවිත සුව පහසුව නොව උතුම් ආදරයේ හැඟීම වන පරිත්‍යාගය තුළ තමයි, දෙවියන් වහන්සේ ආබ්‍රහම්ව විනිශ්චය කරන්නෙ. තම පුතනුවන්ව දවන යාගයක් සේ පුදන්නට දෙවියන් වහන්සේගෙන් ආ අණ තුළ ආබ්‍රහම් මෙසේ කිරීමට සැරසෙද්දීම එය වලක්වන දෙවියන් වහන්සේ, ආබ්‍රහම්ගේ එම විශ්වාසය හා දේව අණට අවනත වීම නිසාම ඔහු මගින් මුළු මහත් පොලෝ තලය මහඟු ආශිර්වාදයක් ලබන බව පවසනවා.

දැන් ඔබට ඔබේ මෙනෙහි කිරීම මේ මත ගොඩ නගා ගෙන යන්නට පුළුවන්, මෙම චතාරික සමයේ අප කරන්නාවූ විවිධ පශ්චත්තාපි ක්‍රියාවන් හා පරිත්‍යාගයන් මගින් එම ආශිර්වාදයමයි, දෙවියන් වහන්සේ අපටත් දනය කරන්නේ. මුළු මහත් ලෝකයම අවනත නොවුවත් එක් මිනිස් හදවතක තිබෙන ආදරයෙන් කීකරු කම ලෝකයට ගෙන එන්නට පිළිවන් බව එයින් පැහැදිලි වෙනවා. ශු. පාවුළු තුමා දක්වන්නෙත් මේ නිදර්ශනයමයි. ආදම් වැනි එක මිනිසෙකුගේ අකීකරුකම් මුළු මිනිස් සංහතියේ වැටීමට හේතු පාදක වූවා සේම ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ වැනි එක මිනිසෙකුගේ කීකරු කම හේතුකොට ගෙන මුළු මහත් මිනිස් සංහතියම ගැලවුම අත්කර ගත් බව පාවුළු තුමා පැහැදිලිව පවසන්නේ ඒ නිසයි.

ආදර දුවේ පුතේ,

ඒ ගමන් මඟ තමයි දෙවැනි ඉරුදින සුවිශේෂයෙන් පෙන්නුම් කරන්නේ. තම ගුරු දේවයනට කුරුසියක් පවරන්න මෙම ශ්‍රාවකයන් කිසිමදක සිතුවේ නැහැ. නමුත් තාබෝර් කඳු මුදුනෙහි අසිරිමත් බව අත් විඳින්නට ජීවිත කුරුස ගමන යා යුතුයි, පාපය අකා මකා දමමින් දුෂ්කර පැවැත්මක් තුළ අත් කර ගන්නා මහිමය සදකාලිකයි. ස්වර්ගය දිනා ගත යුත්තේ කුරුසියේ දුක් විඳීමෙන් බව පෙන්නුම් කරන ජේසුස් ස්වාමින් වහන්සේ තමන් වහන්සේගේ කීකරු කම තුළ මුළු මහත් ලෝකයම ගලවා ගන්නා අයුරු කදිමට මෙම තාබෝර් කඳු මුදුනෙහි නිරූපනය කරනවා. දෙවියන් වහන්සේව දැකිය හැක්කේ කුරුසියේ එම ගමන් මඟ අනුව ජීවිත ගමන ගෙන ගිය අයෙකුට පමණී. විභූතිය අත් පත් කර ගත්තා කියා කඳු මුදුන් වල ක්‍රිස්තු අපේ ජීවිතය හිර කර තබන්නට බැහැ. අපි කඳු බැස නැවතත් මිටියාවත් කරා ගමන් කල යුතුයි. අසීරුවෙන් තරණය කරන කඳු මුදුන් තුළ අපි දකින ශ්‍රී විභූතිය තුළ යාථාර්ථයේ ජීවිතය නැවතත් දකින්නට කඳු පා මුලට යන්නට ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අපට ආරාධනා කරන්නේ ඒ නිසයි.

ආදර දුවේ පුතේ, මේ මෙනෙහි කිරීම සිතු දෙය නොම වේ, නොසිතු දෙයම වේ කියලා නම් කලෙත් ඒ නිසාමයි. ඒ අයුරින් තාබෝර් කන්දේ පණිවිඩය නිරන්තරයෙන් සිහිපත් කරන්නට මේ චතාරික සමයේදී අපි උත්සහ කරමු.

ඔබ සැමට ජේසු පිහිටයි !


සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

සිඟිති කතාව

# පොඩ්ඩා සහ මල්ලියා

ශ්‍රී ලාල් නානායක්කාර



පොඩ්ඩා කම්බි පොට මදක් පහත් කර එතුළින් රිංගා ''මල්ලියා'' අත වූ සරුංගලය වැටට උඩින් ගත්තේය. මල්ලියා ද කම්බි පොට පහත් කර අනෙක් පැත්තට පැන ගත්තේය. සරුංගලයද රැගෙන බඩවැටිය අසලින් කමත වෙත දුවන පොඩ්ඩා පසු පස මල්ලියාද දුවන්නට විය.

''ෂා! .... ..... කිරිටොපියාගෙ සරුංගලේ ලස්සන බලන්නකෝ අයියේ. පාට පාට නයෙක්. වලිගෙ හරි දිගයි.''

මල්ලියා නූල් පන්දුව පොඩ්ඩා අතට දී නිතරම පහතට රූටන කුඩා කලිසම මඳක් උස්කර ගනිමින් කීවේය. ''අපිටත් දිග නයෙක් හදන්න තිබුනා මල්ලියො ... ඒත් අම්මා සල්ලි දුන්නේ සව් කොළයක් ගන්න විතර නේ..... සව්කොළ පහක් හයක් ගන්න සල්ලි දුන්නනං මම හදනවා ලොකු කවුඩෙක් ....'' පොඩ්ඩා නූල් කොන සරුංගලයෙහි පටලවමින් උදම් ඇනුවේ ය. ''එතකොට කිරිටොපියගෙ සරුංගලේ කැළේ ..... නේද? පොඩ්ඩයියේ.........?

මල්ලි කිරිටොපියා නමින් හැඳින් වූ ටිකිරිගේ සරුංගලය දෙස බලා ගත් වනම ප්‍රශ්න කළේය.

ටිකිරි ඇතුළු තවත් ළමෝ පිරිසක් ටිකිරිගේ සරුංගලය ගුවනේ පා කර වීමට සූදානම් වෙති. නූල් පන්දුව ටිකිරා අත තිබියදී තවෙකෙක් සරුංගලය ගෙන ඉපනැන්ලෙහි මඳ දුරක් ගොස් සුළං වේගවත් වූ විට එය අත හැරියේ ය. සරුංගලය රැකුල් ලබමින් ටිකෙන් ටික ගුවනේ ඈතට පාවෙන්නට විය. ඇතැම්හු ප්‍රීතියෙන් අත් පොලසන් දෙති. ටිකිරා අත වූ නූල ගස්සමින් සරුංගලය මුදුන් කරයි. ඔහුගේ මුහුනේ වූ ජයග්‍රාහි සිනා රැල්ල දෙස මල්ලියා මහත් වෑයමකින් බලා සිටියේය. ''හරිද පොඩ්ඩයියේ .........? මල්ලියා මහත් නොඉවසිල්ලෙන් ඇසුවේය.''

''හරි .... මේ සරුංගලේ අරගෙන ටිකක් ඈතට ගිහිල්ල මම කියද්දී අත අරින්න......''

මල්ලියා සරුංගලය රැගෙන ආශාවෙන් ඉපනැල්ලට දිව ගියේය. ටිකිරා ඇතුළු අනෙක් ළමුන් ද තමා දෙසත් සරුංගලය දෙසත් බලා සිටින අයුරු දුටු මල්ලියා ආඩම්බර බවක් පාමින් කට කොනින් සිනා සුනේය.

''හරි ...! ''

පොඩ්ඩාගෙන් මල්ලියාට විධානය ලැබුණි. ඔහු සරුංගලය අතහැරියේය. වේගවත් සුළඟට අසු වී මඳක් ඉහළට ගිය සරුංගලය සැනෙකින් කැරැකැවී වේගයෙව් බිම ඇනුණි. ''කොහෙන්ද ඔය කොම්බු රජා හොයා ගත්තේ ...
හි: ...... හි: ......... හි: ........!''

අනෙක් ළමුන් අතරින් එකෙක් ඇසු වේය. ඔවුහු කොක් හඬ ලා සිනාසෙති. මල්ලියා ඉපනැල්ලෙහි ඇනී ඇති සරුංගලට අතට ගත්තේය.

''සරුංගලේ පැත්තක් බරයි, ඒකයි කොම්බු ගහන්නේ....'' පොඩ්ඩා සරුංගලයෙහි එක් පැත්තක රැල් කීපයක් කඩා දමා කීවේය. ඔවුහු නැවත සරුංගලය ගුවනේ පා කරවීමට උත්සාහ ගත්තෝය. පෙර පරිද්දෙන් ම ඒ උත්සාහයෙන්ද ඵලක් නොවීය. බිම පතිත වූ සරුංගලය ඉපනැල්ලට මඳක් ඉරී තිබුණි. අනෙකුන්ගෙන් නැගෙන ''හූ'' හඬ හා සිනා හඬ මල්ලියාට හා පොඩ්ඩාට ඉවසුම් නොදෙන්නක් විය.

ටිකිරාගේ සරුංගලය ගුවනේ ඈතින් ඈතට පාවී ගොස් තිබුණි. එය දැන් පෙනෙන්නේ ඉතා කුඩාවටය. පොඩ්ඩා හා මල්ලියා සය සරුංගලය දෙස කණගාටුවෙන් බලා සිටියේ ය.

''ආ ... න්න .... ආන්න ... සරුංගලේ කඩාගෙන ගියා...අයියෝ ... අර ...අර ...'' වේගවත් සුළං පාරට අසුව ගසා ගෙන යන තම සරුංගලය දෙස බලා ගත් වනම ටිකිරා කෑගැසුවේ ය. ඔවුන් කර කියා ගත හැකි දෙයක් නොමැතිව මවිතව බලා සිටියහ.

සුළං පහරට අසුව ගසාගෙන යන ටිකිරාගේ සරුංගලය දෙස බලා සිටි පොඩ්ඩා සෙමෙන් සෙමෙන් මල්ලියා දෙස බැලුවේ ය. මල්ලියා පණුවන් කෑ සිගිති දත් පෙන්වා සිනාසුනේ ය. පොඩ්ඩාද මල්ලියාගෙ සිනාවට එකු වුනේය. ටිකිරාගේ සරුංගලය ඈත පොල් රුප්පා අතරින් නොපෙනී ගියේ ය.

# ජේසු ඉන්නේ කොහෙද?




ආදර දුවේ ,පුතේ ඔන්න දැන් ආයෙමත් චතාරික සමය ඇරඹිලා. අළු බදාදා දිනෙන් ආරම්භ වු චතාරිකයට දින 40 ක් ඇතුළත් වෙනවා.මෙය වරප්‍රසාදජනක කලයකි. මෙම සමයේදී අපගේ පාපී බව පිළිගෙන සැබෑ ලෙසින් මනස්ථාපනය වී අප ජීවිතයේ සැබෑ වෙනසක් ඇති කර ගැනීමට සිතට ගත යුතුය.



ඔයාලට පොඩි කතන්දරයක් කියන්නයි මම යන්නේ,
ඔන්න දුවේ, පුතේ එක ගමක නහයට අහන්නැති (ගොඩක් අකීකරු) පොඩි කොල්ලෝ දෙන්නෙක් හිටියා. මේ දෙන්නා ගොඩක් දඟ වැඩ කලා. දවසක් අහල පහල නිවෙසක වීදුරුවක් බිඳී තිබුණා.

ඒවගේම ගෙවල් වල සුරතලේට ඇති කල සතුන්ට හිංසාවක් වු විට එයට අනිවාර්යයෙන් වගකිව යුතු මේ දෙන්නා බැව් අසල්වසි සියල්ලෝම දැන සිටියා. මොවුන් දෙදෙනා වරදක් කළ පසු හැසිරෙන්නේ මුකුත් නොකළ හොර පුසෝ වගේ, වයස අවුරුදු 8 ක් සහ 10 ක් වන මෙම සහෝදරයෝ කරන දඟවැඩ හින්දා ඔවුන්ගේ දෙමාපියන්ද මහත් අසීරුතාවයට පත් වුණා. ඔවුන් කල්පනා කලා මෙයට මොකද කරන්න ඕනෑ කියලා පස්සේ මොවුන් කල්පනා කරලා මේ බැව් පියතුමාට දැන්වුවා.

දවසක් පියතුමා ගමේ හැම ළමයෙකුටම එන්න කිව්වා. පොඩි රැස්වීමක් තියන්න. මෙයට අර මම මුලින් කිව්ව අයියා මලෝ දෙන්නගෙන් මල්ලිත් ඇවිත් හිටියා. පියතුමා ඇවිත් ඉන්න පිරිසට ජේසු ගැන කතාන්දරයක් කිව්වා.

එකපාරටම පියතුමා ඇසුවා දඟකාර ළමයාගෙන් ''පුතේ ජේසු ඉන්නේ කොහෙද ? '' කියලා ඔහු නිහඬව බලා සිටියා පියතුමා ආයිත් ඇහුවා ''පුතේ ජේසු ඉන්නේ කොහෙද? '' කියලා, තුන්වෙනි වතාවටත් ඇසුවා. මොහු ඉන්පසු දුවගෙන ඉක්මනට ගෙදර ගියා..... පියතුමාද යතුරු පැදියෙන් ඔහු පසු පසම ගියා......

කලබලයෙන් ගෙදර දුවගෙන ආපු මොහු ඉක්මනට ඇදයට හැංගුනා. මල්ලීගේ කලබලය දුටු අයියා මේ පිළිබඳව විමසුවා, මල්ලි මොකද ප්‍රශ්නේ ?. මෙසේ අසන විටම පියතුමාද නිවසට පැමිණියා. පියතුමා ආ බවක් දන්වන්න එපයි ඔහුට පියතුමන් විසින් දැන්වුවා..... ඇඳයට රිංගලා හිටපු අර කොළුවා අයියා අහපු ප්‍රශ්ණයට මෙහෙම උත්තර දුන්නා.

බලපන්කෝ අයියේ, අපේ පල්ලියේ ජේසුගේ සුරුවම නැතිවෙලා ද කොහෙද? ෆාදර් මාව ඒකටත් අල්ලගෙන මගෙන් ඇහුවා පුතේ ජේසු ඉන්නේ කෙහේද ? කියලා .... එක පාරක් නෙමේ තුන් පාරක්ම ඇහුවා..
ආදර දුවේ පුතේ, ඇත්තම ජේසු ඉන්නේ කොහෙද? ඔයගොල්ලන්ට ජේසුව මුණ ගැහිලා තියනවාද ?... ඔයාලා දන්නවද ජේසු ඉන්නේ කොහෙද කියලා, එහෙනම් මේ චතාරිකයේදී අපි කොහොමද ජේසුව හොයගන්නේ, ඒ සඳහා මොනවද කරන්නේ ඕනේ කියලා මම මීළඟ ලිපියෙන් ඔබට කියන්නම් !

ජේසු පිහිටයි.



දුම්මලදෙණිය සාන්ත නිකුලා දෙව් මැඳුරේ දරු දැරියෝ විසි දෙදෙනෙකු පසුගියදා පළමුවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබුහ. දහම් ගුරුවරියන් හා මීසම් සේවක ගරු ජස්ටින් වර්ණකුල පියතුමා සමඟ දිව බොදුන් ලැබු ළමුන් ළමා ප්‍රදීපය සඳහා සමුහ සේයා රුවකට පෙනී සිටි අයුරු. **(දුම්මලදෙනියේ නෙලී)**

# "ළමා ප්‍රදීපය වැඩියෙන්ම අලෙවි වන පාසලේ ළමුන්හට ළමා ලේඛක වැඩමුළුවක් පැවැත්වීමට ලැබීම සතුටකි."

## ළමා ප්‍රදීපය සහය සංස්කාරක 25 වන ළමා ලේඛක වැඩමුළුව පවත්වමින් මීගමුව සා. ජෝශප් විදුහලේ දී පවසති.



සේයා - මැල්කන් පීරිස්

'අද දිනය මට අමතක නොවන දවසක්. ලංකාවේ වැඩියෙන්ම ළමා ප්‍රදීපය මිලිදී ගන්නා ඔබ පාසලේදී මාගේ 25 වන ළමා ලේඛක වැඩමුළුව පැවැත්වීමට ලැබීම ගැන මම ගොඩාක් සතුටු වෙනවා.''

ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා මේ බැව් සඳහන් කරනු ලැබුවේ පසුගිය ද මීගමුව සා. ජෝශප් ශාබා විදුහලේ 6,7 ශ්‍රේණිවල ළමුන් සඳහා විදුහල් ශාලාවේ පැවැත්වූ ළමා ලේඛක වැඩමුළුවකට සහභාගී වෙමිනි. මෙයට සිසු සිසුවියෝ 320 ක් සහභාගී වූහ. දේශක මහතා මෙයට එක් වූ ළමුන්ට ජනසන්නිවේදනය, පුවත්පත් කලාව හා ලේඛන කලාව පිළිබඳව ඉතා සරල අයුරින් ළමුන්ගේ අවධානය දිනාගනිමින් ආකර්ශණීය ලෙස තම දැනුම ළමුන්ට ලබාදීම කැපීපෙනෙන්නකි.

මෙහිදී නිර්මාණයක් කරන අයුරු. මේ සඳහා වස්තුබීජ සපයා ගන්නා අයුරු හා සාර්ථක නිර්මාණයක් කිරීමට අවශ්‍ය කරුණු කාරණා පිළිබඳව ළමෝ දැනුවත් කළහ. අවසානයේ දී ළමුන්ට අභ්‍යාසයක්ද ලබාදී ඉන් වඩාත් සාර්ථක නිර්මාණයන් ළමා ප්‍රදීපය පුවත්පතේ පළ කිරීමද ළමුන්ට ලැබුණු සුවිශේෂී වූ අවස්ථාවකි.

මෙම ළමා ලේඛක වැඩමුළුව මීගමුව සා. ජෝශප් ශාබා පාසලේ විදුහල්පති ගරු සුදත් ගුණතිලක පියතුමාගේ අනුශාසකත්වයෙන් ආචාර්ය මඩුල්ලේ ගරු ගයාන් ප්‍රසන්න පියතුමන් විසින් 6 සහ 7 ශ්‍රේණිවල ගුරුභවතුන්ගේ සහයෝගයෙන් සංවිධානය කෙරෙනි. මෙදින අවස්ථාවන් සේයා රුවෙහි දිස්වේ.

**සටහන :- ජනක පාරිස්**
**ආචාර්ය මඩුල්ල**
**සා. ජෝශප් ශාබා**
**පාසල - මීගමුව**



# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

පසුගිය සතිය සබැඳේ.....

## ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර

★ ශුද්ධවූ මතෙව් සහ ශුද්ධවූ ලූක් තුමා ගෙනහැරපාන මංගල වාක්‍ය හෙවත් භාග්‍ය අට පිළිබඳ සැසඳීමක් කරන්න.

| ශුද්ධ වු මතෙව් 5 / 1-12 | ශුද්ධ වු ලූක් 6 / 20-23 |
|---|---|
| • කන්ද උඩ දේශනය ජේසුස් වහන්සේ වදාළ ප්‍රධාන ධර්ම සාකච්ඡා පහෙන් පළමු සාකච්ඡාව මෙය වේ. | • තැනිතලාවේ දේශනය |
| • දීර්ඝව විස්තර කරයි. | • ලූක්ගේ වාර්තාව කෙටිය |
| • ආශිර්වාද වාක්‍යයන්ගෙන් පටන්ගෙන අත්තිවාරම් දෙක පිළිබඳ උපමාවෙන් අවසන් කරයි. | • ආශිර්වාද වාක්‍යයන්ගෙන් පටන්ගෙන අත්තිවාරම් දෙක පිළිබඳ උපමාවෙන් අවසන් කරයි. |
| • මතෙව් තම දේව ධාර්මින දැක්ම පුරාණ ගිවිසුම් සම්ප්‍රදායන් මත පිහිටුවා ඉදිරිපත් කරයි. සීනයි කන්ද මතදී දේව අනාවරණයන් ඉගැන්වීම් (නික්මයාම 20/1 17 හා ජේසුස් වහන්සේ මෙම නව ඉගැන්වීම් කළ අවස්ථාව අතර සමාන්තර බවක් දක්නට ඇත. මතෙව් 5/21,27,37). | • ජුදෙව් නොවන පාඨකයන්ට මෝසෙස්ගේ ව්‍යවස්ථා වලිය වැදගත් නොවන බැවින් ඒ පිළිබඳ විස්තර ලූක් ඇතුළත් කර නැත. |
| • ආශිර්වාද වාක්‍ය 08 කි. | • ආශිර්වාද වාක්‍ය 04 ක් සහ විපත්ති වාක්‍ය 04 කි. |
| • මෙය මතෙව් අදහස් කළේ ස්වර්ගීක විපාක ගෙන දෙන නව ජීවිතයකට සැලැස්මක් හැටියටය. | • ලූක් ආශිර්වාද වාක්‍ය හා විපත්ති වාක්‍ය දෙකෙන්ම මෙම ජීවිතයේ භෞතික තත්ත්වය ගැන කථා කරයි. |
| • මතෙව්ට අනුව ජේසුස් වහන්සේ මේවා සියල්ලන්ටම පොදුවේ ආමන්ත්‍රණය කළ සේක. | • ලූක්ට අනුව ජේසුස් වහන්සේ මේවා ශ්‍රාවකයින්ට ආමන්ත්‍රණය කළ සේක. |

★ **කිසියම් පුද්ගලයෙක් භාග්‍යවන්ත ද, කියා සොයා බලන ක්‍රම 04 ක් නම් කරන්න.**

- තෘප්තිමත්ව සිටීම.
- දෙවියන් වහන්සේ දර්ශනය කිරීම.
- ජේසුස් වහන්සේ වෙනුවෙන් සම්පූර්ණයෙන් කැප වී සිටිම.
- දෙවියන් වහන්සේගේ විශ්‍රාමයට ඇතුළු වීම.

★ **දෙවින් වහන්සේ පව්කාරයන් කෙරෙහි කරුණාව දක්වන බව සඳහාන් ලූක් සුවිශේෂයේ උපමා තුනක් නම් කරන්න.**

- නැති වූ බැටළුවා පිළිබඳ උපමාව (ලූක් 15 / 1-8)
- නැති වූ කාසිය පිළිබඳ උපමාව (ලූක් 15 / 8-10)
- නැති වූ පුත්‍රයා පිළිබඳ උපමාව (ලූක් 15 /11-32)

★ **විවිධ වහල්කම්වලින් පීඩා විඳින ජනතාව මුදාගන්නට ක්‍රිස්තුන් වහන්සේ පෙන්වූ දේව රාජ්‍යයේ සලකුණු 04 ක් නම් කරන්න. (සාමාන්‍ය පෙළ : 2001 / 03 / අ)**

- මරණයේ වහල්කමෙන් නිදහස් කරගැනීම සඳහා කළ ප්‍රාතිහාර්යය

  උදා :- ජයිරස්ගේ දියණිය උත්ථාන කිරීම - නායින් නුවර වැන්දඹුවගේ පුතා උත්ථානය කිරීම

- විවිධ ලෙඩ රෝගවල වහල්කමින් නිදහස් කරගැනීම සඳහා කළ ප්‍රාතිහාර්ය.

  උදා :- අංශභාග රෝගියා සුවපත් කිරීම

**ඉදිරිපත් කිරීම ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.**

- ස්වභාවික බලවේගවලට යටවීමේ වහල්කමෙන් නිදහස් කර ගැනීමට කළ ප්‍රාතිහාර්ය

  උදා :- මාරුත දමනය, කුණාටුව සංසිඳවීම

- යක්ෂයාගේ වහල්කමෙන් නිදහස් කරගැනීම සඳහා කළ ප්‍රාතිහාර්යය

  උදා :- අශුද්ධාත්මයක් ආවේශ වුවකුට සුවය (ලූක් 4 /31-37 : ලූක් සුබ අස්නෙහි සඳහන් වන ජේසුස් වහන්සේ කළ පළමු වන සුව කිරීමේ හාස්කම මෙය වේ )

★ **පාස්කු අභිරහස වශයෙන් අදහස් කරන්නේ (සාමාන්‍ය පෙළ : 2004 /26)**

- ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම, මරණය සහ උත්ථානයයි.

★ **උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ සභාවට පැවරූ වගකීම් තුන ඉදිරිපත් කරන්න. (සාමාන්‍ය පෙළ : 2003 / 07/ අ)**

| | |
|---|---|
| • ධර්මදානය | • ''එබැවින් ඔබ ගොස් සකල ජාතීන් ශ්‍රාවකයින් කරන්න'' (මතෙව් 28/19) |
| • ජනවන්දනා පැවැත්වීම හා ප්‍රසාද නිධාන දානය කිරීම | • ''පියාණන්ගෙ ද, පුත්‍රයාණන්ගේ ද, ශුද්ධාත්මයාණන් ද, නාමයෙන් බව්තිස්ම ස්නාපනය කරන්න.'' (මතෙව් 28/19 ) ''ශුද්ධාත්මයාණන් පිළිගන්න. ඔබ යමකුගේ පව් කමා කරන්නාහුද ඒවා කමා කරනු ලැබේ. ඔබ යමෙකුගේ පව් කමා නොකරන්නාහුද ඒවා කමා නොකරනු ලැබේ.'' (ජොහාන් 20/23) |
| • ධර්මෝපදේශය | • ''මා ඔබට අණ කළ සියල්ල රක්ෂා කරන්න ඔවුන්ට උගන්වන්න'' (මතෙව් 28/ 20) |

★ **ජේසුස් ක්‍රිස්තුන් වහන්සේව ජීවත් කළ මුල් කිතුනු පිළිබඳව ලබන සතියේදී විමසා බලමු.**

# නාගොඩ ශුද්ධවූ ස්නාවක ජුවාම් දහම් පාසලේ සහ තැ
# ළමා ලේඛක වැඩමුළුවන්හි දී ලබා දුන් නිර්මාණ

**අපගේ දිව්‍ය භෝජනය**

නම්සර ප්‍රනාන්දු
10 ශ්‍රේණිය
ශු. ස්නාවක ජුවාම් දහම් පාසල - නාගොඩ




## අළුයම



කඳු මුදුනින් හිරු පායා එයි
පිනිබිඳු දිලිසෙයි හිරු රැස් වැටී
මල් විකසිතවෙයි කුරුළු නිදින්
අළුයම පිබිදෙයි අපි සැවොමා

කිවි බිවි හඬින් ළමුන් අවදි වී
පාසල් යන්නට සුදු ඇඳුමින් සැරසී
සුදු කොක්කු රැනක් සේ
ලොව පුබුදුවයි අපි සැවොමා

**සිත්මි මල්ෂානි පෙරේරා**
09 ශ්‍රේණිය
ශු. ස්නාවක ජුවාම් මුනි දහම් පාසල
නාගොඩ



**අපගේ ආදර**
**දේව අම්මා**

ටී. ශෙහාරා ඕෂනී සිල්වා
10 ශ්‍රේණිය
ශු ස්නාවක ජුවාම් දහම් පාසල
නාගොඩ

## දේව මැවිල්ලේ අසිරිය

දෙවිඳුන් මැව් මේ ලොවෙහි
බැලු බැලු තැන මනහරය
ගස් කොළින් පිරුණු මෙය
බලන බලන තැන ලස්සනය
කුරුළු නදින් ගී ඇසෙනා
සතුන් එහෙ මෙහෙ
අත දුවනා
බලන බලන තැන හරිම
ලස්සනය

**අධීෂ මිහිරාන් ප්‍රනාන්දු**
11 ශ්‍රේණිය
ශු ස්නාවක ජුවාම් දහම් පාසල
නාගොඩ



## ගුරු මෑණියනි, ගුරු පියාණෙනි

විදුමව් තුරුලේ
ජීවය ඔබ විය
ශිල්ප ගඟුලින්
එගොඩ වන්නට
හබල ලෙස අත දෙන්නේ
ඔබයි අප ආදරණීය
ගුරු මෑණියෙනී
ගුරු පියාණෙනී

**චදුනි ලක්ෂිකා ප්‍රනාන්දු**
07 ශ්‍රේණිය
සා. සේවියර් දහම් පාසල
තල්ගහපිටිය



# ල්ගහපිටිය මීසමේ දහම් පාසල් ළමුන් සඳහා පැවැත්වූ අභ්‍යාස වලින් වඩාත් සාර්ථක වූ නිර්මාණයන්...

## චතාරික සමය

චතාරික සමය යනු අප මනස්ථාපනය විය යුතු කාලයයි. මෙහිදී අප මර්ධන ක්‍රියා කලයුතු අතර අපට හැකි පමණින් අනෙක් පුද්ගලයන් සමඟ බෙදා ගත යුතුය.

ජේසුස් වහන්සේ බරවූ කුරුසිය කර තබාගෙන කල්වාරි කන්ද නැග්ගේ අප සියළු දෙනා වෙනුවෙනි. අප අපගේ පව් වලට මනස්ථාපනය වී උන්වහන්සේගේ කුරුසියේ බර අඩුකළ යුතුය. ඒ අප වැරදි කරන වාරයක් පාසාම උන්වහන්සේගේ කුරුසියේ බර වැඩිවීමයි. එම නිසා අප කළ යුත්තේ අපගේ පව්වලට මනස්ථාපනය වී තව තවත් ජේසුස් වහන්සේට සමීප වී යහපත් ජීවිතයක් ගත කිරීමයි.

**කවිශ්ක දිල්හාර**
08 ශ්‍රේණිය
සා. සේවියර් දහම් පාසල - තල්ගහපිටිය



**රෝස කුසුමේ දේව මාතාවෝ**

නවීන් හේෂාන්
07 ශ්‍රේණිය
ශු ආරෝග්‍ය දේව මාතා දහම් පාසල - කරව්වැව

තල්ගහපිටිය මීසම

## නොනිම් මව් සෙනෙහස

දස මසක් කුස තුළ දරා
මා මෙලොවට බිහිකළ
ආදර අම්මා
මා ඉපදුනු මොහොතේ
සිට මේ දක්වා
ආදරයෙන් මා බලාගත්
ලෙඩ දුකේදී පවා
මා සමඟ සිට
දිවා රැයෙහි වෙහෙසුනා
ඔබ අම්මේ
ම හට අවවාද අනුශාසනා දී
මා පෝෂණය කළ, ඇති දැඩි
කල ආදර අම්මේ
මම ඔබට සැමද ආදරෙයි.....

**නිෂිනි කෞෂල්‍යා උදයංගනී**
10 ශ්‍රේණිය
ශු. ජපමාල මාතා දහම් පාසල
හිරිගොල්ල - තල්ගහපිටිය

## මාපිය සෙනෙහස

දසමස කුස දරා මා
මොළොවට බිහිකර
හෙළු දුක් කඳුළු
බොහොමය රැකගත්ත
අඟ හිඟ කම් ඇතත් ගෙවූ
ජීවිත තුළ ආදර කරුණා
ගුණයේ සාරය ඇත
ඔබ හදතුළ

රස ආහර කවමින්
ආදර බස් දුන්නා
රැය දහවල නොබලා
ඔබ නිදි මැරුවා
දුකේ සැපේදී ඔබ
මා ළඟ උන්නා
මේ ජීවිත කතර ගැන
ඔබ පහදා දුන්නා

**උෂාඩි අංජුලා**
09 ශ්‍රේණිය
ශු. ඌගෝ මුනිඳු දහම් පාසල
වීරකොඩියාන
තල්ගහපිටිය මීසම


## නොනිම් පිය සෙනෙහස




දහදුක් කඳුළු මැදින් ගෙවියන ඔබේ
ජීවිතය, අප වෙනුවෙනි පියේ
ඔබේ දහදිය කඳුළු සැමදා
වැගිරුණේ නිමක්
නොමැති ජීවිතය තුළ
ආදරය, සෙනෙහස
පොදි බැඳි ගෙන
අපව උස් මහත්
කෙරුමට ගව් ගානක් දුර
රටක තනිවුවා ඔබ
කාත් කවුරුත් නොමැති
රටක තනිවී කෙතරම්
සැඩ කුණාටු ආවද
එය සතුටක් යැයි පවසමින්, අපවද සනසමින්
නිරතුරු ව අප ළඟ නොමැති වුවද
ආදර පියේ ඔබේ සෙනෙහස කෙසේ කියම් ද
කෙදිනෙක හෝ අපේ පුංචි කැදැල්ලට
එන්න හනිකට පියඹා පියේ

**රොනාලි තරුෂිකා මලින්ති**
11 ශ්‍රේණිය
සා. සේවියර් දහම් පාසල - තල්ගහපිටිය

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා



General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

**ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.** **පාඩම් අංක : 45**

දැන් අපි මෙතෙක් ඉගෙන ගත් <u>ප්‍රමාණය සහ සංඛ්‍යාව</u> ගැන කියවෙන every/ all/ whole/ many/few/ much යනාදි වචන ආශ්‍රිතව අභ්‍යාස කරල දැනුම තහවුරු කරගනිමු.

**<u>අභ්‍යාසය</u>**

**all/ everything / everybody / everyone** යනාදිය යොදා හිස්තැන් පුරවන්න.

1. ........enjoyed the party (හැමකෙනෙක්ම) හැමකෙනෙක්ම සාදය රසවින්දා.
2. ............ has weaknesses. .................is perfect.
   හැමකෙනෙක්ටම දුර්වලකම් තියෙනවා. කිසිවෙක් සම්පූර්ණ නෑ.
3. ................... I have eaten today is a banana.
   අද දවසටම මම කාපු එකම දේ කෙසෙල්ගෙඩියක් විතරයි.
4. ................. nothing has changed. ............. is the same as it was.
   කිසිදෙයක් වෙනස් වෙලා නෑ. හැමදේම කලින් වගේමයි.
5. Mary told me.........about her.
   මේරි මට එයා ගැන හැමදෙයක්ම කිව්වා.
6. Can......... write their names on the answer paper please?
   කරුණාකරල හැමකෙනෙක්ම තමන්ගේ නම් මේ උත්තර පත්තරේ ලියනවද?
7. .............. I had was Rs. 100.
   මා ළඟ තිබුණු මුදල රු. 100 ක් පමණයි.
8. .................. had come when I went to the class.
   මම පන්තියට යද්දි හැමකෙනාම ඇවිත් තිබුණා.
9. I repaired the car. Now .................. is Ok.
   මම කාරෙක හැදුවා. දැන් හැමදේම හරි.
10. .................. in our class has passed the exam.
    අපේ පන්තියෙ හැම ළමයෙක්ම විභාගෙ පාස්.

**<u>පිළිතුරු</u>**

**all/ everything / everybody / everyone** යනාදිය යොදා හිස්තැන් පුරවන්න.

1. **<u>Everybody</u>** enjoyed the party (හැමකෙනෙක්ම)
   හැමකෙනෙක්ම සාදය රසවින්දා.
2. **<u>Everybody</u>** has weaknesses. **<u>Nobody</u>** is perfect.
   හැමකෙනෙක්ටම දුර්වලකම් තියෙනවා. කිසිවෙක් සම්පූර්ණ නෑ.
3. **<u>All</u>** I have eaten today is a banana.
   අද දවසටම මම කාපු එකම දේ කෙසෙල්ගෙඩියක් විතරයි.
4. Nothing has changed. **<u>Everything</u>** is the same as it was.
   කිසිදෙයක් වෙනස් වෙලා නෑ. හැමදේම කලින් වගේමයි.
5. Mary told me **<u>everything</u>** about her.
   මේරි මට එයා ගැන හැමදෙයක්ම කිව්වා.
6. Can **<u>everybody</u>** write their names on the answer paper please?
   කරුණාකරල හැමකෙනෙක්ම තමන්ගේ නම් මේ උත්තර පත්තරේ ලියනවද?
7. **<u>All</u>** I had was Rs. 100.
   මා ළඟ තිබුණු මුදල රු. 100 ක් පමණයි.
8. **<u>Everybody</u>** had come when I went to the class.
   මම පන්තියට යද්දි හැමකෙනාම ඇවිත් තිබුණා.
9. I repaired the car. Now **<u>everything</u>** is Ok.
   මම කාරෙක හැදුවා. දැන් හැමදේම හරි.
10. **<u>Everybody</u>** in our class has passed the exam.
    අපේ පන්තියෙ හැම ළමයෙක්ම විභාගෙ පාස්.

අපි අළුත් පාඩමකට යන්න කලින් පසුගිය සතිවල ඉගෙනගත් much / many / little / few / a lot යනාදි වචන වාක්‍යවල යෙදෙන හැටි අභ්‍යාසයක් තුළින් තහවුරු කරගනිමු.

***<u>අභ්‍යාසය</u>***

**<u>much</u> <u>many</u>** හෝ **<u>a lot</u>** යොදා පහත වැකිවල හිස්තැන් පුරවන්න.

1. අපි මුදල් වැඩිය වියදම් කළේ නෑ.
   We didn't spend ................ money.
2. කමලා තේ ගොඩක් බොනවා.
   Kamala drinks ............. tea.

3. සුරනි කෑම වලට ලුනු ගොඩක් දානවා.
Surani puts............ salt on her food.

4. අපි ඉක්මනට යමු. අපට වැඩි වේලාවක් නෑ.
Let's go quickly. we haven't got ........... time.

5. ඉන්දියාවට යන්න වැඩි ගාණක් වුනේ නෑ.
It didn't cost .......... to go to India.

6. මම මේ නගරයේ මිනිස්සු ගොඩක් දෙනකුව දන්නේ නෑ.
I don't know............people in this town.

7. ගිය සතියේ මම වැඩිය දුරකථනය ගොඩක් පාවිච්චි කළා.
I used the phone.......... last week.

8. ඒ ගොල්ලන්ට සල්ලි කොච්චර තියෙනවද කිව්වොත් ඒවාට මොකද කරන්නෙ කියල එයාල දන්නෙ නෑ.They have so ............ money they don't know what to do with it.

## **Much / Many / Few or Little** යොදා හිස්තැන් පුරවන්න.

9. ඔහු තනිව ඉන්න කෙනෙක්. ඔහුට යාළුවො නැති තරම්. (ඉතා සුළු ගාණක්)
He is a loner, He has ..................... friends.

10. අරුණ මේ දිනවල හරිම කාර්යබහුලයි. ඔහුට විවේකය හරි අඩුයි.
Aruna is very busy these days. He has .............. free time.

11. ඔයා නුවරඑළි ගියාම පොටෝ ගොඩක් ගත්තද?
Did you take ................. photos when you went to N'Eliya?

12. මම අද කාර්යබහුල නෑ. අද මට වැඩ ගොඩක් නෑ.
I am not busy today. I haven't got ......... to do.

13. සිනමාශාලාව සෙනඟගෙන් පිරී තිබුණා. සෙනග ගොඩක් හිටියා.
The cinema was very crowded. there were too ...... people.

14. ටවුමෙ වැඩි හරියක් නවීකරණය වෙලා. පැරණි ගොඩනැගිලි තියෙන්නෙ අතලොස්සයි.
Most of the town is modern. There are.......... old buildings.

15. දේශගුණය හරි වියළිවයි තිබුනෙ. වැස්ස හරි ටිකයි.
The weather has been dry. we had......... rain.

16. ඇය වාසනාවන්තයි. ඇයට ප්‍රශ්ණ නැති තරම්.
She is lucky. she has ........ problems.

17. මට මුලින්ම ප්‍රශ්න කීපයක් විසඳාගන්න තියෙනවා.
I have to solve ............. problems first.

18. මට පොත් හලෙන් පොත් කීපයක් ගන්න තියෙනවා.
I want to buy .............. books from the bookshop.

19. මට මේ ගැන හිතන්න ටිකක් කල් ඕන.
I need .......... time to think about this.

20. ට්‍රැෆික් හරි අඩුයි. ඒ නිසා අපි ඉක්මනට ආවා.
There was........ traffic. so we came early.

**ගලපන්න**

21. ඉක්මන්වෙන්න අවශ්‍ය නෑ
There's no need to hurry.

22. එයාට මුදල් ප්‍රශ්ණ නෑ.
He has no financial problems.

23. ඇවිත් අපිත් එක්ක වාඩිවෙන්න.
Come and sit with us.

24. කාන්ති ගොඩක් දේ දන්නවා.
Kanthi knows a lot but....

25. ඒක හරි ලස්සන නගරයක්
It's a very beautiful city.

26. අපිට ඉන්න තැනක් සොයාගත හැකියි.
We can find a place to stay.

(A) ඇයට ගොඩක් දේ ඉගෙන ගන්න තියෙනවා.
She has plenty to learn.

(B) හොඳට ඉඩ තියෙනවා.
There is plenty of room.

(C) අපිට ඕන තරං වෙලා තියෙනවා.
We have plenty of time.

(D) ගස් ගොඩක් එහි තියෙනවා.
There are plenty of trees in it.

(E) ගොඩක් හෝටල් තියෙනවා.
There are plenty of hotels.

(F) මොහුට ගොඩක් සල්ලි තියෙනවා.
He has plenty of money.

***පිළිතුරු***

1. We didn't spend **much** money.
2. Kamala drinks **a lot of** tea.
3. Surani puts **a lot of** salt on her food.
4. Let's go quickly. we haven't got **much** time.
5. It didn't cost **much** to go to India.
6. I don't know **a lot / many** people in this town.
7. I used the phone **a lot** last week.
8. They have so **much** money they don't know what to do with it.
9. He is a loner, He has **few** friends.
10. Aruna is very busy these days. He has **little** free time.
11. Did you take **many** photos when you went to N'Eliya?
12. I am not busy today. I haven't got **much** to do.
13. The cinema was very crowded. there were too **many** people.
14. Most of the town is modern. There are **few** old buildings.
15. The weather has been dry. We had **little** rain.
16. She is lucky. She has **few** problems.
17. I have to solve a **few** problems first.
18. I want to buy a **few** books from the bookshop.
19. I need **a little** time to think about this.
20. There was **little** traffic. so we came early.

21 - C
22 - F
23 - B
24 - A
25 - D
26 - E

පුංචි අපේ චිත්‍ර පිටුව


**මීගමුව සා. ජෝශප් ශාඛා පාසලේ 6, 7 ශ්‍රේණිවල සිසුන් සඳහා පැවැත්වූ ළමා ලේඛක වැඩමුළුවේ චිත්‍ර අංශයේ අභ්‍යාසයන්හි ජයග්‍රාහී නිර්මාණ**



**මල් වත්තක්**
ප්‍රලීෂා රොයෝමී
06 ශ්‍රේණිය



**ආදම් සහ ඒව**
සඳලි දිව්‍යාංජලි සිල්වා
07 ශ්‍රේණිය



**මෝස්තරයක්**
ඉෂිනි මදුෂානි
07 ශ්‍රේණිය



**ධීවර ජීවිතය**
සෙව්වන්දි නිරුෂිකා
07 ශ්‍රේණිය



**දිව්‍ය භෝජනයෙන් පෝෂණය වෙමු.**
නිෂ්මි අශේකා
06 ශ්‍රේණිය



**දිය ඇල්ලක්**
මාෂින් ලක්සයුරු ෆොන්සේකා
06 ශ්‍රේණිය



**දිය බීමට පැමිණි මුව රංචුවක්**
හිරුණි උත්පලා
07 ශ්‍රේණිය



**ඉර බැස යන සැන්දෑවක්**
රිෂිත පෙරේරා
06 ශ්‍රේණිය

# සැබෑ විශ්වාසයකින් දිවිගෙවා දේව බලය අත්දකිමු



## ජේසුගෙන් ළමා ඔබට



විශ්වාසය දුර්වල වූ විට ජේසු සමග සම්බන්ධතා බිඳ වැටී, දේව සැලැස්ම තේරුම් නොගෙන නොමඟ යන හැටි ඔබට පසුගිය ලිපියෙන් පෙන්වා දුනිමි.

දෙවි පියාණන් වහන්සේ විශේෂ කාර්යයන් සඳහා තෝරා ගන්නේ දුර්වල මිනිසුන්ය. පසුව දුර්වලයන් ප්‍රබලයන් කර දේව සැලැස්ම ඉටු කර ගනියි. මෝසෙස් පාරාවෝ රජු වෙතට යාමට භිය විය. ඔහු කථාවට දක්ෂයකු නොවන බව දෙවිඳුන්ට පැවසූ විට, උන්වහන්සේ ඔහු අත තිබූ සැරයටිය හාස්කම් පෑමේ බලයක් බවට පත් කළ සේක.

''සැරයටිය '' යනු කුමක්ද? ඔබ හිතනවා ඇති මැජික් කරන පොල්ලක් කියලා. කොහෙත් ම නැත. එය හාස්කම් පෑමේ දේව බලය වන ''භිය සැක නැති අචල විශ්වාසයයි'' දෙවියන් වහන්සේ ප්‍රසාද ස්නාපනය ලබන දවසේ අපි සියළු දෙනාට ම සැරයටියක් තිළිණ කළ සේක. ඒ සැරයටිය නම් ක්‍රිස්තුන් වහන්සේ යි. මොසෙස් තුමා සැරයටියෙන් හාස්කම් පෑවා සේ ක්‍රිස්තුන් වහන්සේ ද අප තුළ වැඩ වසමින් පුදුම ක්‍රියා, ප්‍රාතිහාර්යයන් කරන සේක. අපගේ විශ්වාසයේ ගමන තුළ ජේසුගේ පුදුම ක්‍රියා අත්දැකිය යුතුයි. ඒ සඳහා අවශ්‍ය වන්නේ ජේසුව දෙවියන් ලෙස විශ්වාස කර උන්වහන්සේගේ ප්‍රේමයේ පණාත ජීවත් වීමයි.''ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. මා අදහන්නා මා කරන ක්‍රියාද කරන්නේ ය. ඔබ මාගේ නාමයෙන් අයදින කවර දෙයක් වුවද මම ඉටු කරන්නෙමි ''

(ජුවාම් 14/12,14)

නික්මයාම 4/1-9 මෙනෙහි කර ඔබත් මෝසෙස් මෙන් ප්‍රබලයකු වන්න

ප්‍රැන්සිස්කාන නිකායික
ගරු ශීරෝම් ප්‍රනාන්දු පැවිදි සොයුරිය

**" මාසික සිතිවිල්ල " ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ පළ කෙරේ**

## වින්සෙන්තියානු හා ගිහිදූත සේවා ගැන තඹකන්ද මීසම දරුවෝ දැනුවත් කෙරෙති



පසුගිය ද කුරුණෑගල රදගුරු පදවියේ රජත ජයන්ති වර්ෂය නිමිති කොට ගෙන තඹකන්ද මීසමේ දරුවන්ට විසෙන්තියානු සේවාව හා ගිහිදූත සේවය පිළිබඳව දැනුවත් කෙරෙනි. මෙම වැඩසටහන සාන්ත වින්සන් ද පාවුලා සමිති කුරුණෑගල පදවි ජාතික නියෝජිත පැට්‍රික් විතානගේ මහතාගේ මූලිකත්වයෙන් තඹකන්ද දෙව්මැඳුරු පරිශ්‍රයේදී පැවැත්වුණි. ඡායාරූපයෙහි ඩබ්ලිව්. එච්. වසන්ත හේරත් මහතා දේශනය පවත්වන අයුරු මෙහි දිස්වේ. තඹකන්ද මීසම් සේවක ගරු ස්ටැන්ලි පීරිස් පියතුමාද සේයාරුවෙහි සිටි. (තියබොල්ඩ් සමරතුංග)

# ජාත්‍යන්තර බැඩ්මින්ටන් තරඟාවලියක දී ශ්‍රී ලංකාපිල නියෝජනය කළ ක්‍රීඩිකාවක්



ගරු විදුහල්පතිනිය (මැද) පුහුණු කරු සමග සඳුනිකා බියන්විල

ශ්‍රී ලංකා පාසල් බැඩ්මින්ටන් පිටියට විශිෂ්ට ක්‍රීඩිකාවන් ගණනාවක් දායාද කළ ගම්පහ සිරිකුරුස විදුහලෙන් පාසල් බැඩ්මින්ටන් පිටියට දායාද කළ **සඳුනිකා පෙට්‍රෝනිල්ඩා බියන්විල** දක්ෂ ක්‍රීඩිකාවකි. ඇය කඩවත ශා. අවිල්ලීනු මුනිතුමාගේ දහම් පාසලේ අධ්‍යාපනය ලබන්නීයි.

ගම්පහ සිරිකුරුස විද්‍යාලයේ 10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඇය 2011 ජාතික කනිෂ්ඨ බැඩ්මින්ටන් තරඟාවලියේ දී (සමස්ත ලංකා )15 පහළ යුගල ඉසව්වේදී තෙවන ස්ථානය දිනා ගත්තාය. එම දක්ෂතා අනුව 2011 දෙසැම්බර් මස සිංගප්පූරුවේ පැවති ''ලීනිං ජාත්‍යන්තර බැඩ්මින්ටන් තරඟාලිය'' සඳහා ශ්‍රී ලංකා අවුරුදු 15 න් පහළ බැඩ්මින්ටන් කණ්ඩායම නියෝජනය කිරීමට වරම් ලබා ගත්තාය. 2012 වසරේ සිරිකුරුස විද්‍යාලයේ බැඩ්මින්ටන් උප නායිකාව වශයෙන් ද ඇය කටයුතු කරයි. 2011 වසරේ සමස්ත ලංකා අවුරුදු 15 න් පහළ යුගල කණ්ඩායම් තරඟාවලියේ දී අනුශූරතාවය දිනා ගත් කණ්ඩායම් නායිකාව වූයේ ද ඇයයි.

වයස අවුරුදු 10 දී, බැඩ්මින්ටන් ක්‍රීඩාවට අවතීර්ණ වූ ඇය අනාගතයේ බැඩ්මින්ටන් ක්‍රීඩාවෙන් තවත් ඉදිරියට යාමට බලාපොරොත්තු වෙයි. ඇගේ පුහුණුකරු වශයෙන් කටයුතු කරනුයේ ප්‍රවීණ පුහුණුකරු මහේෂ් ඒකනායක මහතායි.

සඳුනිකා මේ දක්වා පැමිණි ගමනට අත්වැලක් වූ ඇගේ දෙමාපියන්, සිරිකුරුස විද්‍යාලයේ විදුහල්පතිනි ගරු මේරි දීපානි, නියෝජ්‍ය විදුහල්පති ගරු මේරි දර්ශිකා යන පැවිදි සොයුරියෝ, පුහුණුකරු මහේෂ් ඒකනායක මහතා සහ ඇගේ හිතවත් බැඩ්මින්ටන් ක්‍රීඩා කරන මිතුරියන් ද ආදරයෙන් සිහිපත් කරයි.

**සලනි රුක්ෂානි ඩයස්**



කඳාන ද මැසිනොද් විදුහලේ වාර්ෂික නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන විධායක අධ්‍යක්ෂ ජ්න්ස්ලි ජේ. අලස් මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා විදුහල් ප්‍රධාන ක්‍රීඩා සංකීර්ණයේ දී පැවැත්විණි. එහිදි මාක්, ඕල්බන් , රොමොල්ඩ්, ඩිලාසාල් නිවාස අතුරෙන් ලකුණු 430 ක් ලබා ගනිමින් ඕල්බඩ් නිවාසය ශූරතාවය දිනා ගත්හ. ඔවුන්ට හිමි ශූරතා කුසලානය අලස් මහතා හා විදුහල්පති ගරු බර්ට්‍රම් පෙරේරා සහෝදරතුමා අතින් ලබා ගත් අයුරු සේයාරුවෙහි දිස්වේ. ඇන්ටන් ජයසූරිය.




බෝපිටිය ලෝයලා විදුහලේ නිවාසාන්තර ක්‍රීඩා උළෙල බෝපිටිය මහජන ක්‍රීඩාංගණයේ පසුගියදා පැවත්වුණි.

එහිදී ලකුණු 735 ක් ලබා ශූරතාවය දිනා ගනු ලැබුණේ ඇන්ටන් නිවාසයයි. නිවාස නායක ශිෂ්‍යයා කෝට්ටේ ශා. තෝමස් විදුහලේ හිටපු විදුහල්පති, අති උතුම් මැක්ස්වල් සිල්වා කොළඹ සහයක රදගුරු හිමිපාණන් ගෙන් ශූරතා පලිහ ලබාගත් අයුරු



**එස්.කේ.ජේ. කුරේරා.**

## ළමා ඔබගේ නිර්මාණයන් කිතුනු ළමා හමුවට යොමු කිරීමට දැන් ඔබටත් අවස්ථාවක්!

**ළමා ඔබගේ නිර්මාණයන් කිතුනු ළමා හමුවට යොමු කිරීමට දැන් ඔබටත් අවස්ථාවක් ළමා ඔබගේ නිර්මාණයන්** ඔබේ නම, ශ්‍රේණිය, පාසල, දහම් පාසල, දුරකතන අංකය ඔබ අයත් මීසම ආදි තොරතුරුද ඇතුලත් කර **පහත ලිපිනයට යොමු කරන්න.**
**''කිතුනු ළමා හමුව'' ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව , කොළඹ 07.**

## මල්කඩුවාව ලූර්දු ළමා නිවාසයේ මංගල්‍යය සැමරේ




මල්කඩුවාව ලූර්දු ළමා නිවාසයේ වාර්ෂික මංගල්‍යය පසුගිද සැමරීය. ලූර්දු ළමා නිවාසයේ ප්‍රධාන මව්තුමිය වන ගරු කැතරින් ලියනආරච්චි (ශු.ප.නි) පැවදි සොයුරිය ඇතුළු ගරු පැවිදි සොයුරියන් හා දැරියන්ගේ ආරාධනයෙන් කුරුණෑගල පදවි එඬේරාණන් වන අති උතුම් හැරල්ඩ් ඇන්තනී පෙරේරා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සහ විශ්‍රාමික රදගුරු අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන් ඇතුළු ගරු පියතුමන්ලා පැවදි සොයුරියන් හා ගිහි ජනතාවගේ සහභාගීත්වයෙන් මෙය පැවැත්වුණි.

මංගල්‍යය දිව්‍ය පූජා යාගය මල්කඩුවාව පාතිමා දෙව්මැඳුරේ දී ඔප්පු කිරීමෙන් අනතුරුව ලූර්දු ළමා නිවාස ශාලාවේදී විවිධ ප්‍රසංගය පැවැත්විණි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ. **ශානක ක්‍රිසන්ත මුහන්දිරම්**

## වැල්ලවත්ත සා. ලෝරන්ස් කන්‍යාරාමයේ සංගීත සන්ධ්‍යාව



''මියුසික් අබ්ලේස්'' (Musk Ablae) සංගීත සන්ධ්‍යාව ඉදිරිපත් කළ වැල්ලවත්ත සා. ලෝරන්ස් කන්‍යාරාමයේ ප්‍රාථමික ගායනා කණ්ඩායම එදින තම හැකියාවන් නිරූපනය කළ අයුරු.

## ප්‍රහේලිකා අංක 29

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | 2 | | 3 | ■ |
| | ■ | | ■ | | ■ |
| 4 | | | ■ | 5 | 6 |
| ■ | ■ | | ■ | ■ | |
| 7 | ■ | ■ | 8 | | |
| 9 | | | | ■ | ■ |

**හරහට**

1. අධෛර්යවත් නොවී නොකඩවා යාච්ඤා කළයුතු බව දක්වන පිණිස ක්‍රිස්තුන් වහන්සේ, ........ හා විනිශ්චකාරයා පිළිබඳ උපමාව වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය
4. ක්‍රිස්තුන් වහන්සේ උකුත් වීමට පෙර මධ්‍යහන වේලාවේදී රටපුරා අන්ධකාරයක් පහළ වී එය ..... තුන දක්වා පැතිරුණු බව ශු. බයිබලයේ සඳහන් වේ. මෙහි හිස්තැනට සුදුසු වචනය
5. ක්‍රිස්තුන් වහන්සේ ඇණ ගසන ලද කුරුසිය මුදුනේ ''ජුදෙව්වරුන්ගේ ....... මොහුය'' කියා ලියන ලද පුවරුවක් එල්ලා තිබිනි. මෙහි හිස්තැනට සුදුසු වචනය.
8. යම් මිනිසෙකුගේ මෙය තුළින් ඔහුව හඳුනාගත හැකි අයුරු උපදේශකයා හෙවත් සිරාක් විස්තර කරයි.
9. ක්‍රිස්තුන් වහන්සේගේ අත්වල ඇණ කැළැල් දැක ඇණ ගසා තිබූ තැන්වල ඇඟිල්ල තබා බලනතුරු ක්‍රිස්තු උත්ථානය මෙසේ කිරීමට තෝමස් ශ්‍රාවකයා මැලිවිය.

**පහළට**

1. අහසින් වැටෙන හිම හා වසින ..... නැවත හැරී නොගොස් පොළොව සරුසාරකර මිනිසාට ආහාර දෙනසේ දේව වචනය හිස්ව හැරී නොගොස් අදහස් ඉටුකරන බව යෙසායා දිවැසිවරයාගේ ග්‍රන්ථයේ සඳහන් වෙයි. හිස්තැනට සුදුසු වචනය
2. පුප වැඩිකිරීමේ ප්‍රාතිහාර්යේ රොටී අනුබව කල පුරුෂයින් පමණක් පන් ...... වු බව ශු. බයිබලයේ සඳහාන් වෙයි. හිස්තැනට සුදුසු වචනය.
3. ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රථම ප්‍රාතිහාර්යේදී උන්වහන්සේ මේවා වයින් බවට හැරවූ සේක.

06. ...... හා මරණය සිහිකර විශ්වාසවන්ත ලෙස පණත් ඉටු කරන්නැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. හිස්තැනට සුදුසු වචනය

07. ක්‍රිස්තුන් වහන්සේගේ වචනය අසා පිළිපදින අය .....ශක්තිමත් අත්තිවාරමක් මත ගෙයක් ගොඩනැගූ මිනිසෙකුට සමාන බව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය

08. ක්‍රිස්තුන් වහන්සේ ඇණ ගැසීමට පෙර මේවා වලින් පහරදුන් බව ශු. බයිබලයේ සඳහන් වේ.

(මෙම ප්‍රහේළිකාව පිරවීමේදී පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ලුක් 18,23,7, පරිච්ඡේද ශු. මාක් 6, ශු. ජුවාම් 2,20, යෙසායා 55 උපදේශකයා හෙවත් සිරාක් 28, 27/4-7)

( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )

ශුද්ධ ලියැවිල්ලේ දිවැසිවර චරිතාපදාන ළමා ප්‍රදීපය ඔබ වෙත රැගෙන එයි

සැකසුම : තිළිණ අලහකෝන්

